# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2114/57 – 2019 මාර්තු 15 වැනි සිකුරාදා – 2019.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 34 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 4-3/7/2017/එච්ඩබ්ලිව්/38.

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* 3/2/3/10/261.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමීත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**ගයන්ත කරුණාතිලක,**
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 පෙබරවාරි මස 12 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, අත්තනගල්ල.

2. **ඉඩමේ විස්තරය** – බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහ පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 328ඒ තල්ගස්මොටේ සහ 329බී හිරිපිටිය (නැගෙනහිර) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හිරිපිටිය සහ තල්ගස්මොටේ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/අත්/2013/523 හා

1A – G029664– 16 (2019/03)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2015.10.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ලාවුළුගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0052**
උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ ඇළ; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මාර්ගය.

02. **කැබලි අක්ෂර 'බී' – ලාවුළුගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0171**
උතුරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ලාවුළුගහකුඹුර, මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ජේ. ඒ. ප්‍රියන්ත උපුල් හිමිකම් කියන ලාවුළුගහකුඹුර; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ලාවුළුගහකුඹුර සහ ජේ. ඒ. ප්‍රියන්ත උපුල් හිමිකම් කියන ලාවුළුගහකුඹුර; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ලාවුළුගහකුඹුර.

03. **කැබලි අක්ෂර 'සී' – ලාවුළුගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0077**
උතුරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ලාවුළුගහකුඹුර සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: ඇළ.

03 - 1483

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2019 අංක 42 දරන ආඥාව

*මගේ යොමු අංකය*: 4-3/7/2017/එච්ඩබ්ලිව්/44.

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: 3/2/3/10/272.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**ගයන්ත කරුණාතිලක,**
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 මාර්තු මස 06 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, අත්තනගල්ල.

2. **ඉඩමේ විස්තරය** – බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 348/ඒ, නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නිට්ටඹුව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/ATT/2017/309 හා 2017.10.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලින් යුත් මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – අඹගහවත්ත හෙවත් මිරිස්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0028**
උතුරට: මාර්ගය (මා.සං.අ.) ඩබ්. ඒ. සරත් කුමාර වීරකෝන් හිමිකම් කියන අඹගහවත්ත සහ එන්. එම්. ඉන්ද්‍රානි හිමිකම් කියන අඹගහවත්ත හෙවත් මිරිස්වත්ත; නැගෙනහිරට: එන්. එම්. ඉන්ද්‍රානි හිමිකම් කියන අඹගහවත්ත හෙවත් මිරිස්වත්ත, එන්. එම්. සරත් කුමාර හිමිකම් කියන අඹගහවත්ත හෙවත් මිරිස්වත්ත සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.).

03 - 1484

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.